**ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම - 2018**

-----------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** | | |
| (අ) ප්‍රමිතයෙහි 2.5.2 ඡේදය ප්‍රකාරව ආදායම් වියදම් හිලව් නොකල යුතු වුවත්, යක්කල වැලි විකුණුම් මධ්‍යස්ථානයේ වැලි තොග ප්‍රවාහන වියදම වූ රු.24,144,313 එහි ආදායමට හිලව් කර ශුද්ධ අගය වූ රු.12,150,034 ආදායම ලෙස දක්වා තිබුණි. | වැලි තොග ප්‍රවාහන වියදම ආදායමට හිලව් කර ශුද්ධ අගය පෙන්වීමක් සිදුවී නොමැති අතර වැලි මිල තීරණය කිරීමේදී ඇතිවූ එකඟතාවයක් මත අදාළ ප්‍රවාහන වියදම වගකීම් ගිණුමකට බැර කොට ගිණුම්ගත කරන ලදි. | ප්‍රමිතියේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |
| (ආ) ප්‍රමිතයෙහි 4.4 හා 4.5 ඡේද ප්‍රකාරව ජංගම වත්කම් යටතේ දැක්විය යුතු රු.16,025,583 ක් වූ කෙටිකාලීන ආයෝජන ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | 2019 වර්ෂයේ සිට ස්ථාවර තැන්පතු ජංගම වත්කම් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිතයෙහි 11.21 ඡේදය ප්‍රකාරව හානිකරන අලාභ හඳුනාගැනීමට කටයුතු කළ යුතු වන අතර සමාගමේ 2019 මාර්තු 31 දිනට එකතුව රු.106,266,872 ක් වූ ලැබිය යුතු අගය තුල වර්ෂ 5 ඉක්මවූ ශේෂ රු.10,529,725 ක් පැවතියද ඒ සඳහා ප්‍රමිතය අනුව කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව 2019 වර්ෂයේ සිට හානිකරණ අලාභ හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ඈ) | ප්‍රමිතයෙහි 17.19 ඡේදය ප්‍රකාර සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.50,368,512 ක් වූ ස්ථාවර වත්කම් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කමේ ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රමිත ප්‍රකාරව ස්ථාවර වත්කම් වල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කමේ ඵලදායී ජීව කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ඉ) | ප්‍රමිතයෙහි 21.15 ඡේදය ප්‍රකාරව බාහිර පාර්ශවයක් විසින් සමාගමට එරෙහිව පවරා තිබූ නඩුවක් සම්බන්ධව මූල්‍ය වාර්තාවල හෙළිදරව් කර නොතිබුණි. | අදාළ නඩු කටයුතු පිළිබඳ තොරතුරු අධ්‍යයනය කර ඉදිරි වර්ෂයේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් කරනු ලබන බව දන්වා සිටිමි. | - එම - |
| (ඊ) | ප්‍රමිතයෙහි 28.15 ඡේදය ප්‍රකාර පාරිතෝෂික සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | පාරිතෝෂික සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය 3.7 ඡේදය යටතේ ඇතුලත් කර ඇත. ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කිරීමෙහි අඩුපාඩු වෙතොත් ඒවා ඉදිරියේදී නිවැරදි ලෙස දැක්වීමට බලාපොරොත්තු වෙමි. | - එම - |
| (උ) | ප්‍රමිතයෙහි 29.27 සහ 29.31 ඡේද ප්‍රකාර විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | විලම්භිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය 3.2 ඡේදය යටතේ ඇතුළත් කර ඇත. අදාළ ඉදිරිපත් කිරීමෙහි අඩුපාඩු වෙතොත් ඒවා ඉදිරියේදී නිවැරදි ලෙස දැක්වීමට බලාපොරොත්තු වෙමි. | - එම - |
| (ඌ) | ප්‍රමිතයෙහි 33.9 ඡේදය ප්‍රකාරව මූල්‍ය වාර්තාවල සම්බන්ධිත පාර්ශව වශයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලැබිය යුතු රු.25,930,990 ක ශේෂයක් දක්වා තිබුණද ඊට අදාල හෙළිදරව් කල යුතු තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු ශේෂ පිළිබඳ 2019 වර්ෂයේ සිට හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | - එම - |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායක මුදල් රු.564,017 ක් හා සේවක පාරිතෝෂික වියදම් රු.139,837 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබූ අතර 2019 මාර්තු 31 දිනට ගෙවිය යුතු දායක මුදල් රු.339,694 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2019/2020 ගිණුම් වර්ෂය තුල නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |
| (ආ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.9,053,153 ක ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඉන් රු.7,237,068 ක් විගණිත ගිණුම් වාර්තා ලැබීමට පෙර ගෙවා තිබුණි. | 2019/2020 වර්ෂයේදී ප්‍රසාද දීමනා ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සිදුකර ඇත. ඉදිරි මූල්‍ය වර්ෂ වලදී විගණිත ගිණුම් වාර්තා ලැබීමෙන් පසු ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසාද දීමනා නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |
| (ඇ) | නුගේගොඩ පවත්වා තිබූ වැලි පැකට් අලෙවි මධ්‍යස්ථානයේ අලාභය ගණනයේදී රු.1,031,332 ක වියදම් ඊට ඇතුළත් කර නොතිබුණි. | පළමුවරට වැලි පැකට් වෙළඳපලට හඳුන්වාදීමේදී වැය කරන ලද රු.767,332 ක් හා මධ්‍යස්ථානය ඉදිරියේ ප්‍රදර්ශන පුවරුවක් සවි කිරීමට දැරූ රු.264,000 ක් අලාභය ගණනයේදී ඇතුලත්ව නොමැත. | වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුයි. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2019-2023 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව රු.2,295,918 (බදු රහිත) කට බාහිර පෞද්ගලික ආයතනයක් වෙතින් පිළියෙල කරගෙන තිබුණි. එම සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර නොතිබූ අතර විගණනයට ඉදිරිපත් කරද නොතිබුණි. | 2019 – 2023 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරියේදී ඉදිරිපත් කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතු අතර සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල යුතුයි. |
| (ආ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සංයුක්ත සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සංයුක්ත සැලැස්ම සකස් | අධ්‍යක්ෂ මණ්ඩල |

| | | | |
|---|---|---|---|
| | සමාගම විසින් රු.2,244,898 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද රහිතව පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. | කිරීම වෙනුවෙන් රු.2,581,632 ක්(එකතු කළ අගය මත බදු සහිතව) 2019 අගෝස්තු 16 දින ගෙවා ඇත. | අනුමැතිය මත ගෙවීම් කල අතර බාහිර ආයතනවල වියදම් නොදැරිය යුතුය. |
| (ඇ) | නුගේගොඩ පවත්වාගෙන ගොස් තිබූ වැලි පැකට් අලෙවි කිරීමේ ව්‍යාපෘතිය දියත් කිරීමේ උත්සවය වෙනුවෙන් රු.767,331 ක් වැය කිරීමට හා රු.79,500 ක් අලාභ ලබමින් වැලි පැකට් මිල අඩුකර විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. අලෙවි කිරීමේ මධ්‍යස්ථානයේ අලෙවිය 2019 මාර්තු සිට නවතා තිබුණද ගොඩනැගිලි කුලී ගිවිසුම අප්‍රේල් දක්වා පැවතීම හේතුවෙන් ගොඩනැගිලි කුලිය රු.150,000 ක් නිශ්කාර්යව ගෙවා තිබුණි. | වැලි පැකට් ව්‍යාපෘතිය අලුතින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියක් වීම හේතුවෙන් ඒ සඳහා ආරම්භ කිරීමේදී ආරම්භක පිරිවැයක් දැරීමට සිදුවිය. 2019 මැයි මස සිට නව මිල ක්‍රමය යටතේ වැලි බෑග් අලෙවි කෙරුණි. කිසිදු විටක වැලි පැකට් වල මිල අඩුකර විකුණා නොමැත. මාර්තු මස වැලි අලෙවි මධ්‍යස්ථානය නවතා දැමීමෙන් පසු එම ස්ථානය කොටස් වෙන් කර ගබඩා අංශය, කැනීම් අංශය, විශේෂ ව්‍යාපෘති අංශය සඳහා ලබාදී ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

------------------------------------

### 1.6.1 ලැබිය යුතු මුදල්

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ ලබාදී තිබූ රු.3,591,549 ක බෝට්ටු ණය ලබාදුන් පුද්ගලයන් නොවීම හා අයකර ගැනීමට නිසි ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් රු.445,476 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | වැලි ගොඩදැමීම සඳහා කම්කරු සේවය ලබා ගැනීමට කම්කරුවන්ට අවශ්‍ය බෝට්ටු සහ බාල්දි ලබා ගැනීමට ආයතනය මගින් ණය මුදලක් ලබා දීමට කටයුතු කර ඇත. සේවයට නොපැමිණි කම්කරුවන්ගෙන් එම ණය මුදල් පියවා ගැනීමට නොහැකි වී ඇත. මේ පිළිබඳ පරීක්ෂා කර අයකර ගැනීමේ හැකියාව සොයා බැලීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | ණය අයකර ගැනීමට නිසි ක්‍රමවේදයක් තිබිය යුතුයි. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනත | | | |
| | (i) 5(2) වගන්තිය | ණය ගෙවීමට හැකියාව ඇති බවට සහතිකයක් විගණක වෙතින් ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017/2018 මූල්‍ය වර්ෂයට අදාලව කොටසකට රු.10 බැගින් රු.6,000,000 ක ලාභාංශ ගෙවා තිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට ණය ගෙවීමේ හැකියාව ඇති බවට සහතිකයක් විගණකාධිපති වෙතින් ලබා ගනිමින් ලාභාංශ ගෙවීමට කටයුතු කරනු ලැබේ. | පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |
| | (ii) 133 වගන්තිය | 2018 ලිත් වර්ෂය සඳහා වාර්ෂික මහා රැස්වීමක් පවත්වා නොතිබුණි. | වාර්ෂික මහා සභා රැස්වීම හා සුහද හමුව පැවැත්වීමට සැලසුම් කර තිබුණද 2018 ඔක්තෝබර් 25 වන දින රටේ ඇති වූ දේශපාලන වාතාවරණය හේතු කොට ගෙන සැලසුම් ප්‍රකාරව වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට නොහැකි වූ අතර නියමිත දිනට සුහද හමුව පමණක් පැවැත්වීමට සිදුවිය. | - එම - |
| | (iii) 166 වගන්තිය | 2017/2018 මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී එම වාර්ෂික වාර්තාව අදාල පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ආ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනතේ 03 වන කොටසේ 10(6) වගන්තිය | සේවක පාරිශ්‍රමික ගෙවීමේදී මුද්දර ගාස්තු අයකර ගෙන දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | සේවකයන්ගෙන් අයකර ගෙන ඇති මුද්දර ගාස්තු ද සමඟ ඉදිරියේදී දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |

| | | | |
|---|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 135 | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව මුල්‍ය බලතල පැවරීම් සිදුකර නොතිබුණි. | 2018 ඔක්තෝබර් 03 දිනැති GSMBTS/129/12 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුල්‍ය බලතල පැවරීමක් සිදුකරන ලදි. මින් ඉදිරියට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුල්‍ය බලතල පැවරීම වාර්ෂිකව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| (ii) මුදල් රෙගුලාසි 756, 507(2) හා 507(3) | ස්ථාවර වත්කම් සමීක්ෂණයට භාජනය කර සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රවර්තන වර්ෂයේ සිට නිසි පරිදි ස්ථාවර වත්කම් සමීක්ෂණය කර වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 6.5.3 ඡේදය | 2015/2016, 2016/2017 සහ 2017/2018 යන වර්ෂවල මුල්‍ය වාර්තා විගණන වාර්තාව සමඟ 2019 ජූලි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | ඉදිරියේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ii) 8.3.3 ඡේදය | ගෙවිය යුතු ප්‍රසාද දීමනාවේ උපරිමය මාස 2 ක වැටුප වුවද මාස 3 ක දළ වැටුප පදනම් කරගෙන රු.9,063,153 ක් 2017/2018 වර්ෂයේ ප්‍රසාද දීමනා ලෙස සේවකයන්ට ගෙවා තිබුණි. | සමාගම විසින් බදු පෙර ලාභය පදනම් කර ගනිමින් සෑම සේවකයෙකු සඳහාම දීමනා වශයෙන් මාස තුනක දළ වැටුප නොව මූලික වැටුප පදනම් කරගෙන ප්‍රසාද දීමනා ගෙවා ඇත. | - එම - |
| (iii) 8.3.9 ඡේදය | චක්‍රලේඛයට පටහැනිව 2018 හා 2019 වර්ෂවල භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සේවකයන්ට තෑගි වවුචර් ලබාදීම සඳහා රු.2,596,500 ක් වැය කර තිබුණි. අනුමැතියකින් තොරව සමාගමේ සේවකයන් දෙදෙනෙකු ආරක්ෂක අමාත්‍යාංශයේ සහ ජනාධිපති කාර්යාලයේ ඩෙංගු රෝග නිවාරණ කාර්යසාධන බලකාය වෙත නිදහස් කර 2018 | 2018 අප්‍රේල් මාසය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සේවකයන්හට තෑගි වවුචර ලබාදී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි වේ. මේ වන විට මෙම සේවකයන්ගේ සේවය අත්හිටුවා ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දක්වා එකතුව රු.1,103,296 ක් වූ වැටුප් හා වේතන සමාගමෙන් ගෙවා තිබුණි. | | |
| (ඉ) 2015 ජුනි 17 දිනැති අංක PED 03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 2.2 ඡේදය | රේඛීය අමාත්‍යවරයාගේ එකඟතාවය හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සභාපතිවරයාට රු.50,000 ක මාසික දීමනාවක්ද එක් අධ්‍යක්ෂවරයෙකුට රු.6,000 ක් හා අධ්‍යක්ෂවරු තිදෙනෙකුට රු.11,000 බැගින් වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගීත්ව දීමනා වශයෙන්ද එකතුව රු.1,051,929 ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය අනුව සභාපති දීමනා හා සහභාගිත්ව දීමනා සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ii) 2.5 ඡේදය | මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියෙන් මාසයකට රු.20,000 බැගින් එකතුව රු.233,571 ක දීමනා සභාපති වෙත ගෙවා තිබුණි. | 2019 මාර්තු මස සිට මෙම දීමනාව ලබා නොදීමට කටයුතු කර ඇත. | - එම - |
| (iii) 2.8 ඡේදය | සමාගමේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සඳහා රු.100,000 බැගින් රු.300,000 ක් ගරු දීමනා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි. | සමාගම 2017/2018 මූල්‍ය වර්ෂයේ දී ඉතා ඉහල බදු පසු ශුද්ධ ලාභයක් උපයා තිබීම නිසා ගරු දීමනාවක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි ගෙවා ඇත. ඉදිරියේදී රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (ඊ) 2011 පෙබරවාරි 11 දිනැති අංක PED/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | - එම - |
| (i) 01 ඡේදය | ප්‍රචාරණ හෝ ප්‍රවර්ධන කටයුතු | ආයතනික ප්‍රතිලාභ ළඟා කර ගැනීමේ | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | නොවන සමාජ සත්කාරක කටයුතු හා පරිත්‍යාග සඳහා සංයුක්ත සමාජීය වගකීම් යටතේ රු.2,726,650 ක් ගෙවා තිබුණි. | අරමුණින් නොදරන ලද අතර සමාජ සත්කාරක කටයුත්තක් සේ සළකා සංයුක්ත සමාජීය වගකීම් සංකල්පය පදනම් කරගනිමින් දරන ලදි. | |
| | (ii) 02 හා 03 ඡේද | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රවර්ධන වැඩසටහනක් සකස්කර අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණු අතර සංයුක්ත සමාජීය වගකීම් ඉටුකිරීමේ අරමුදල මගින් වැය කිරීමට අපේක්ෂිත වියදම් අයවැයට ඇතුලත් කරද නොතිබුණි. | 2019 අයවැය ලේඛණයට ඇතුලත් කිරීමටත්, ප්‍රවර්ධන සැලැස්මට ඇතුලත් කිරීමටත්, කටයුතු සම්පාදනය කෙරෙමින් පවතින බව දන්වා සිටිමි. | - එම - |
| | (iii) 05 ඡේදය | ප්‍රචාරණ හා ප්‍රවර්ධන කටයුතු සඳහා අනුමත අයවැය ඉක්මවා රු.9,816,396 ක් වැයකර තිබුණි. | 2020 වර්ෂයේදී විධිමත් ප්‍රවර්ධන සැලැස්මක් සකස් කිරීමටත් එමගින් චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලවීමටත් කටයුතු සම්පාදනය කරනු ලැබේ. | - එම - |
| | (iv) 06 ඡේදය | රාජ්‍ය නොවන ආයතන 6 කට ලබාදී තිබූ එකතුව රු.2,855,276 ක් වූ රු.100,000 ට වැඩි පරිත්‍යාග/ අනුග්‍රාහකත්ව දායක මුදල් සඳහා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර අනුග්‍රාහකත්ව වියදම් රු.507,807 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රහිතව ද රු.2,267,750 ක් අධ්‍යක්ෂ මණ්ඩල ආවරණ අනුමැතිය මත ද ගෙවා තිබුණි. | මින් ඉදිරියට නිසි අනුමැතිය සහිතව පරිත්‍යාග හෝ අනුග්‍රාහකත්වය දැක්වීම සඳහා ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | - එම - |
| (උ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක PED/03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය | ප්‍රසාද දීමනා සඳහා සුදුසුකම් ලැබීමට සපුරා තිබිය යුතු අවශ්‍යතා සපුරා නොමැතිව 2017/2018 වර්ෂයට අදාල ප්‍රසාද දීමනා ලෙස රු.1,751,175 ක් සේවකයන් 145 කට ගෙවා තිබුණි. | 2018/2019 වර්ෂයේදී 2017/2018 මූල්‍ය වර්ෂයේ රු.83,956,128 ක බදු පසු ශුද්ධ ලාභය පදනම් කරගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන එක් සේවකයෙකුට රු.13,500 බැගින් ප්‍රසාද දීමනා ගෙවා ඇත. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය මගින් නියම කර ඇති පරිදි සමාගම විසින් දැනටමත් Colombo Busness School ආයතනය සම්බන්ධ කරගෙන 2019/2023 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරමින් පවතී. | - එම - |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.37,806,854 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.83,956,127 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.46,149,273 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ව්‍යාපෘති ආදායම් රු.2,254,151 කින් හා අනෙකුත් මෙහෙයුම් නොවන ආදායම් රු.7,620,149 කින් වැඩිවී, ආදායම් බදු වියදම රු.20,198,900 කින් අඩු වුවද, ව්‍යාපෘති වියදම් රු.47,302,468 කින්, පරිපාලන වියදම් රු.27,743,697 කින් හා අනෙකුත් මෙහෙයුම් වියදම් රු.1,247,394 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **අනාර්ථික ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ව්‍යාපෘතිවලට අදාල රාජ්‍යභාග හා බදු නියමිත දිනට නොගෙවීම හේතුවෙන් ඊට අදාලව එකතුව රු.1,671,985 ක් දඩ මුදල් ගෙවීමට සිදුවීම නිසා එම වියදම අනාර්ථික වියදමක් වී තිබුණි. | දින 03 ක ප්‍රමාදය ලෙස රු.1,513,857 ක දඩ මුදලක් අය කර ගැනීමට සිදුවන බව සඳහන් කරමින් කාර්යාංශය විසින් ලිපියක් එවා තිබූ අතර ඒ අනුව ප්‍රතිපාදන කරන ලදි.<br>2016/2017 වර්ෂයට අදාලව නොගෙවා තිබූ බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල අතර ඊට අදාළ රු.158,128 ක දඩ මුදල ගෙවීමේ අවිනිශ්චිතතාවය මත 2016/2017 මූල්‍ය වර්ෂයේ සිට සිදු කරන ලද ප්‍රතිපාදනයක් වන මෙය 2018/2019 ගිණුම් තුලදී තවදුරටත් පෙන්වා ඇත. දඩ මුදල ඉවත් කර ගැනීම සඳහා ලිපියක් ද ඉදිරිපත් කරන ලදි. | අදාල මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුයි. |

## 3.2 හඳුනාගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණය | | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යක්කල වැලි විකුණුම් මධ්‍යස්ථානයේ වැලි පැටවුම් යන්ත්‍රයෙන් බාහිර ආයතනවල කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් රු.35,840 ක් ද යන්ත්‍රය ක්‍රියාත්මක නොකරන ලද දින 12 ක් සඳහා ද රු.90,000 ක් ද සමාගම ගෙවා තිබුණි. | වැලි විකුණුම් මධ්‍යස්ථානය විවෘත කිරීමට සමාගාමීව හරිත මංකඩ ආකෘතියක්ද ප්‍රදර්ශනය කිරීමට කටයුතු කිරීමට යෙදුනු බැවින් එහි කටයුතු සඳහා රු.35,840 ක් ගෙවා මෙම යන්ත්‍රය යොදාගත් බව කාරුණිකව දැනුම් දෙමි. | අදාල මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුයි. |
| (ආ) | 2017 වර්ෂයේ සමාගම වෙත පවරන ලද කොටිකම්බොක්ක තිරුවානා නිධියේ කැණීම් කටයුතු 2019 ජූලි දක්වා ආරම්භ කර නොතිබුණි. එසේ වුවද වර්ෂ තුනක් සඳහා කැණීම් කරනු ලබන තිරුවානා ගබඩා කිරීමට ඉඩමක් බදු ගැනීම, තිරුවානා කිරා ගැනීමට බිම් තරාදියක් සවිකිරීම, ආරක්ෂාවට සේවකයන් යෙදවීම සඳහා පිළිවෙලින් රු.2,974,000 ක්, රු.2,530,000 ක් හා රු.3,017,050 ක් ද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.12,699,841 ක් ගෙවා තිබුණු අතර එම වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. බිම් තරාදිය වගකීම් කාලය තුල වර්ෂ 2 මාස 6 ක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිශ්කාර්යව තබා තිබුණි. | 2017 මාර්තු 17 දින ආමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව මෙම තිරුවානා කැණීම් කටයුතු මූලික පාරිසරික අනුමැතියට යටත්ව සිදුකල යුතු බව තීරණය කර තිබුණි. මේ වන විට මූලික පාරිසරික අධීක්ෂණ වාර්තාව අනුමත කරගෙන ඇති හෙයින් ව්‍යාපෘති කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට හැකි වේ. 2016 වසරේ දී බිම් තරාදිය සවි කිරීම නිසා ඉඩමට අඛණ්ඩව ගෙවීමට සිදුවූ බැවින් එම බිම් තරාදියේ සංවේදී උපකරණ ගලවා යක්කල ගබඩාව වෙත ගෙන ඒමත් භූමිය සඳහා ගෙවූ මුදල අවම කිරීමටත් අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකර ඇත. | සැලසුම් සහගතව කටයුතු කල යුතු අතර නිෂ්කාර්ය වියදම් නොදැරීමට කටයුතු කල යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික මහාසභා රැස්වීම හා සේවක සුහද හමුව පැවැත්වීමට සැලසුම් කර රු.2,118,810 ක් වැයකර තිබුණද වාර්ෂික සුහද හමුව පමණක් පවත්වා තිබුණි. | 2018 ඔක්තෝබර් 25 දින වනවිට රටේ ඇති වූ දේශපාලන වාතාවරණය හේතු කොටගෙන නියමිත දිනට සුහද හමුව පමණක් පැවැත්වීමට සිදු විය. | සැලසුම් පරිදි කටයුතු කල යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම පවත්වාගෙන ගොස් තිබූ ඛණිජ හා කැණීම් ව්‍යාපෘති 5 කින් රු.11,505,566 ක් ද පිපුරුම්, අධීක්ෂණ හා උපදේශන සේවා ව්‍යාපෘති 4 කින් රු.3,163,058 ක්ද වූ අලාභ වර්ෂය තුල ලබා තිබුණි. | අම්පාර වැලි ව්‍යාපෘතිය හා හම්බන්තොට බොරළු ව්‍යාපෘතිය නතර කිරීම, කොටිකම්බොක්ක හා කන්තලේ ව්‍යාපෘති ආරම්භ නොකිරීම හා යාන් ඔය ව්‍යාපෘතිය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත පවරා ගැනීම සිදුකලද ඒවායේ සේවකයන්ට හා නඩත්තු කටයුතුවලට වියදම් දැරීමට සිදුවීම හේතුවෙන් අලාභ සිදුවී ඇත.<br>කෙසේ වෙතත් 2019/2020 මූල්‍ය වර්ෂයේ සිට ව්‍යාපෘති දැනට නිම වූ අදියරයන් මත ආදායම ප්‍රතිශතාත්මකව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘති කාර්යක්ෂමව මෙහෙයවීම තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කල යුතුයි. |

## 3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැලි විකුණුම් ලාභය පදනම් කරගෙන ප්‍රසාද දීමනා 2 ක් සමාගමේ සියළු සේවකයන්ට ගෙවා තිබියදී මනම්පිටිය හා වැලිකන්ද වැලි විකුණුම් ව්‍යාපෘතිවල විකුණුම් පදනම් කරගෙන ඉලක්ක ළඟාකර ගැනීමේ දීමනා ලෙස රු.1,588,677 ක්ද එම ව්‍යාපෘතිවල සේවකයන්ට ගෙවා තිබුණි. | වර්තමානය වන විට මනම්පිටිය හා වැලිකන්ද කාර්ය මණ්ඩලයට මෙම දිරි දීමනාව නොගෙවනු ලබන අතර මින් ඉදිරියට නොගෙවීමට ද තීරණය කර ඇත. | විධිවිධාන ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | ඉදිකිරීම් සඳහා වැලි සැපයීම සම්බන්ධයෙන් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් සමාගමට නොතිබුණද ඒ සම්බන්ධ ප්‍රවර්ධනාත්මක සාකච්ඡාවක් සඳහා අනුග්‍රාහකත්වය ලබා ගැනීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් සිදුකල ඉල්ලීමක් වෙනුවෙන් රු.1,173,469 ක් ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තකරුවන්ගේ වාණිජ මණ්ඩලය වෙත සමාගම විසින් ගෙවා තිබුණි. | Chamber Of Construction Industry of sri Lanka ආයතනය මගින් පවත්වන ලද වැඩමුළුව ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සම්බන්ධ කරගනිමින් පැවැත්වූ අතර අනාගතයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයට යොමු වීමේ ව්‍යාපාරික අවස්ථාවක් ළඟා කර ගැනීමේ අපේක්ෂාවෙද සහිතව අදාළ කටයුත්ත සඳහා අනුග්‍රාහකත්වය සපයන ලදි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රවර්ධන වියදම් දැරිය යුතුයි. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත මහවැලි ගඟේ මනම්පිටිය ප්‍රදේශයේ වැලි කැණීම් කටයුතු සමාගම වෙත පැවරී තිබුණු අතර එහි වැලි කැණීම සඳහා සමාගම කැණීම් බලපත්‍ර 92 ක් ලබාගෙන තිබුණි. එම බලපත්‍ර වලින් සමාගම වැලි මංකඩ 36 ක කැණීම් සිදුකරමින් පැවතුණ අතර වැලි මංකඩ 217 ක් කැනීම් සඳහා ගිවිසුමකින් හෝ අනුමැතියකින් තොරව ටිපර් රථ සංගමයකට පවරා තිබුණි. මනම්පිටිය ප්‍රදේශයෙන් කැණීම් කරනු ලබන වැලි සඳහා පවතින අධික ඉල්ලුම හේතුවෙන් වැලි නිකුත් කිරීම නිශ්චිත ක්‍රමවේදයක් මත සිදුකල යුතු වුවද එවැනි ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල කැණීම් කරන ලද වැලි කියුබ් 187,799 කින් වැලි කියුබ් 44,481 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛ සේවා පදනම මත නිකුත් කර තිබූ අතර ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මගින් අපේක්ෂා කර තිබූ පරිදි කොළඹ ඇතුළු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පවතින වැලි හිඟයට විසඳුමක් ලබාදීමට ව්‍යාපෘතිය අපොහොසත්ව තිබුණි. | මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියේ කැණීම් බලපත්‍ර 92 ක් සඳහා කියුබ් 19,320 ක කැණීම් ධාරිතාවයක් පැවති අතර වැලි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා කම්කරුවන් ප්‍රමාණය ඉහළ දැමීමට තුන්වන පාර්ශවයන් සම්බන්ධ කළ අතර මෙම ක්‍රමවේදය යටතේ මාසික වැලි නිෂ්පාදනය කියුබ් 7,000 සිට 19,000 දක්වා ඉහළ නැංවීමට හැකි විය.<br>ටෝකන් ක්‍රමය හරහා වැලි නිකුත් කිරීම සිදුකල අතර, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සහ පොළොන්නරු දිස්ත්‍රික් ලේකම්තුමාගේ නිර්දේශය මත පොළොනන්රුව දිස්ත්‍රිකක්යේ සිදු කරන කඩිනම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වැලි ලබා දීම සිදුකරන ලදි.<br>කොළඹ සහ දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල වැලි අවශ්‍යතාවය සපුරාලීමට හැකි සෑම පියවරක්ම ගනු ලැබේ. | නියමිත ක්‍රමවේද හා අනුමැතීන් මත වැලි කැණීම් හා බෙදාහැරීම් කල යුතු අතර ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

### 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 වසරේදී රු.8,883,520 කට මිලදී ගත් පැටවුම් යන්ත්‍රයක් වර්ෂ 2 මාස 6 ක් නිෂ්කාර්යව තබා තිබුණි. | යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා ඉතා ඉහල මුදලක් වැයවන බැවින් අලුත්වැඩියාව සඳහා ලැබිය යුතු අමාත්‍යාංශ අනුමැතිය නොලැබුනු බව කාරුණිකව දැනුම් දෙමි. | වත්කම භාවිතයට ගැනීමට කටයුතු කල යුතුයි. |

### 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 ප්‍රකාරව 2017/2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2017/2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම එම වර්ෂයේ අයවැය වාර්තාව සමඟ ඉදිරිපත් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම විසින් රු.1,593,057 කට භාණ්ඩ මිලදී ගැනීමේදී හා රු.2,295,918 ක් වැයකර සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. | ඇතැම් අවශ්‍යතාවයන් පුරෝතකනය කිරීමේදී සිදුවු අඩුපාඩු හේතුවෙන් ඇතැම් මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පරිබාහිරව කටයුතු කිරීමට සිදුවීම අඩුපාඩුවක් ලෙස පිළිගනු ලබන අතර ඉදිරියේදී අවශ්‍යතාවයන් නිවැරදිව පුරෝකතනය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | - එම - |
| (ඇ) | සමාගම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී සේවකයන් 63 ක් සැපයීම වෙනුවෙන් රු.29,001,002 ක් ගෙවීම සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි. ගිවිසුම්වලට පටහැනිව ආරක්ෂක සේවා ලබා ගැනීම වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට රු.820,000 ක් ද වාහන කුලී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් රු.476,096 ක් ද ගෙවා තිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත සේවකයන් යෙදවීමේදී ගිවිසුමකට එළඹීමට මේ වන විට කටයුතු කර ඇත. සේවා අවශ්‍යතාවය මත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අතිරේක නිලධාරීන් යොදවාගෙන තිබීම හේතුවෙන් ඒ අනුව ගෙවීම් සිදුකර ඇත. අතපසුවීමකින් ගිවිසුම් සංශෝධනය කිරීමට නොහැකි වී ඇත. වාහන සඳහා ලබාදී ඇති ගිවිසුම තුල අතිකාල දීමනා පිළිබඳව සඳහන් වී නොමැති බවත් අතිකාල සහ මාසික ධාවනයේ සීමාව ඉක්මවූ පසු ඒ සඳහා ගෙවන ආකාරය පිළිබඳ කොන්දේසි මේ වන විට අදාල ගිවිසුම්වලට ඇතුලත් කර ඇත. | ගිවිසුම්වලට එළඹීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 ට පටහැනිව කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 60 දක්වා වු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.916,200 ක් අවස්ථා 3 කදී ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව 60% ක් දක්වා අත්තිකාරම් මුදල් ලබා දීම අඩුපාඩුවක් ලෙස පිළිගනු ලබන අතර මින් ඉදිරියේදී එම අඩුපාඩුව සිදු නොවීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඉ) | නීත්‍යානුකූල ගිවිසුමක් හෝ පැවරීමකින් තොරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ලබාගෙන තිබූ ඉඩමෙන් කොටසක් සමාගම ගිවිසුමකින් තොරව පවරාගෙන තිබුණි. | වැලි මිල පාලනය ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා ඉඩම තුල වැලි අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යැමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ ගම්පහ ප්‍රාදේශීය කාර්යාලයෙහි වාචික එකඟතාවය පලකල බැවින් ගිවිසුමක් අත්සන් කිරීම සිදු නොවුණි. ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ලිඛිත ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ගිවිසුම්වලට එළඹීමට කටයුතු කල යුතුයි. |

## 3.8 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාන්ඔය වැලි කැණීම් ව්‍යාපෘති කාර්යාලයේ භාවිතා කරන ලද සමාගමට අයත් රු.1,833,038 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම අයකර ගැනීමකින් තොරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත පවරා තිබුණි. | ස්ථාවර වත්කම් වටිනාකම අය කර ගැනීම සඳහා 2019 මාර්තු 31 දින රු.2,107,993.39 වටිනාකමින් යුත් ඉන්වොයිස්පතක් නිකුත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ මුළු කාර්ය මණ්ඩලය 256 ක් වූ අතර ඉන් 193 ක් සමාගමේ සේවයේ යොදවා තිබූ අතර 63 ක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත කුලී පදනම මත සපයා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල සමාගම වෙත කොන්ත්‍රාත් පදනම මත තනතුරු 30 ක් සඳහා සේවකයින් 82 ක් බඳවාගෙන තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම සඳහා අවශ්‍ය කරන කාර්යමණ්ඩලය හඳුනා ගැනීමට හෝ අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ආයතනයේ සේවක සැලැස්ම අනුමත කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | සමාගමට අවශ්‍ය කාර්යමණ්ඩලය හඳුනා ගැනීමට හා අනුමත කර ගැනීමට කටයුතු කල යුතුයි. |